# 02 ගීතයේ අභිමානවත් ගමන් මග

පූජ්‍ය පල්ලේගම හේමරතන හිමියන් විසින් රචිත "පහන නිවී දෙළොස් මහේ '' ගීත නිර්මාණ ග්‍රන්ථය සඳහා ඩබ්ලියු .ඒ අබේසිංහ මහතා සැපයූ පෙරවදනින් උපුටා ගත් කොටසක් මේ පාඩමට අන්තර්ගත ය.

කිසියම් ජනතාවකට බසක් ඇත්තේ, හැඟීම් හා අදහස් කියාපෑමට ය. ඒ බසට සාහිත්‍යයක් ඇත්තේ, එකී අදහස් හා හැඟීම් ප්‍රබල ලෙස පවසන්නට ය. එකී සාහිත්‍යයට කවියක් ඇත්තේ, ඒ හැඟීම් හා අදහස් රසවත් ලෙස නිරූපණය කිරීමට ය. කිසියම් ජනතාවක් විසින් එකී කවිය ධ්වනිපූර්ණ නිර්මාණයක් බවට පත් කෙළේ, ස්වකීය හැඟීම් හා අදහස් රසවත් ලෙස පමණක් නො ව මිහිරි සරින් ද ගයන්නට ය.

ජනතාවක් සතු ව ගීත කලාවක් තිබීමෙන් ගම්‍යමාන වන මූලික කාරණා දෙකක් ඇත්තේ ය.ඉන් පළමුවැන්න, එකී ජනතාව ශිෂ්ටසම්පන්න සභ්‍ය ජනතාවක් බව ය. දෙවැන්න, ඔවුන් සතු ව ඉතා ම ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් පවත්නා බව ය.

දෑයක බස, ගීතය දක්වා වර්ධනය වීම යනු ඒ දෑය සභ්‍යත්වයට පැමිණ සිටින බව කියන ප්‍රබල ම සාක්ෂ්‍යය යි. සැබැවින් ම ගීතය දක්වා ඒ බස පැමිණි ගමන, එකී ජාතියේ ශිෂ්ටාචාරය පිළිබඳ කතාන්තරය ද වන්නේ ය. ඒ අතින් සිංහලයෝ ලොවේ මුල් ම දියුණු ජාතීන් කිහිපය අතරට එක්වෙති. ඊට හේතුව ගීය ඔවුන්ගේ සාහිත්‍යයේ මුල් ම අංගයක් වූ බැවිනි. **සීගිරි ගීයත්, සසදවතත්, මුවදෙව්දවතත්** අප සාහිත්‍යයේ සිළුමිණ වූ **කව්සිළුමිණත්** ලොවට කියා සිටින්නේ ඒ බව ය.

අපගේ ආදි ම සිංහලයෝ, සීගිරියේ සුසිනිඳු සුමට කැටපත් පවුර මත ස්වකීය ගී ලියා තැබූහ. මේ ගී ලියූවන් අතර, කව් ලැකිය හා පුරවහර මනා කොට දත් විදග්ධ කවීන් මෙන් ම, ජීවිත තක්සලාවෙන් බොහෝ දේ උගත්, මනා සේ ගම් වහර දත් ගැමි කවියෝ ද වූහ. ඔවුන් කැටපත් පවුර මත ලියූ ගීවල, රසභාව පූර්ණ කාව්‍ය සංකල්ප මෙන් ම ශබ්ද මාධුර්යයෙන් පරිපූර්ණ වූ ගීතාත්මක ස්වරූපය ද විය. මේ පිළිබඳ ව දිය හැකි ප්‍රශස්ත නිදසුන වනුයේ සුප්‍රකට

"නිල් කට්රොල් මලෙකැ - ඇවුණු වැට් කොල් මල් සෙයි
සැන්දගැ සිහි වන්නෙයි - මහනෙල් වනක් හයි රන්වන් හුන් "

නමැති ගීතය යි.

සීගිරියේ ගීය හැඳිනගෙන එහි කාව්‍යමය සංකල්පයත්, ගීත මාධූර්යයත් කිසියම් අපූර්ව සංගීතවේදියකු විසින් ප්‍රතිනිර්මාණය කිරීමෙන් කර්ණ රසායන ගීතාවලියකට වුව ද නැගිය හැකි ය. එවිට කැටපත් පවුර පාදක කොට ගෙන අපගේ පැරණි සිංහල ගීයේ මහිමය හෙවත් ආශ්චර්යය කුමක් දැයි පසක් කරන්නට අපට හැකි වනු නොඅනුමාන ය.

ගීය වූ කලී සිංහලයන්ගේ භාවමය ප්‍රකාශනයකි. එහෙත් එය අපගේ සම්භාව්‍ය සාහිත්‍යය තුළ නිසි ලෙස නොවැඩුණු සාහිත්‍යාංගයක් බව පෙනේ. අප කවීන්ගේ කාව්‍යමය පරිකල්පනයත්, බසෙහි ශබ්ද මාධූර්යය පිළිබඳ රසඥතාවත් පරිපූර්ණ ගීතයකට ළං වන තරමට පරිපාකයට පත්වූයේ කෝට්ටේ සාහිත්‍ය යුගයේ දී ය. සැළලිහිණිය, හංසය ඇතුළු සංදේශ කාව්‍යයන්හිත්, ගුත්තිලය වැනි ඇතැම් පද්‍ය කෘතීන්හිත් දක්නා ලැබෙන්නේ ගීතයක් බවට පත්වන්නට අපගේ සම්භාව්‍ය කාව්‍ය විසින් දරන ලද ව්‍යායාමයකි.



"වස් දඬු බිඟු කොවුල් වීණා නද  මියුරු
රුස්වූ සෙයින් සත්සර ගී රස  සොඳුරු
අස්වන ලියන් දැක ලියකිඳුරඟන  යුරු
තොස් කර තසිත සවනත නුවනත  මිතුරු"

සැළලිහිණියේ එන මේ කවිය, ගායනයෙන් ද, වාදනයෙන් ද එක සේ බැඳුණු ලාස්‍ය නර්තන විලාසයක් නිරූපණය කරනු සඳහා, රහල් හිමියන් විසින් පද බැඳුණු කවක් බැව් අපි දනිමු. මේ කවෙහි වචන හා ධ්වනි සංවිධානය දෙස සීරුවෙන් බලන කෙනකුට, අපගේ බස, ගීතයක් වීමට කොතරම් ළංව තිබුණේ දැ යි වටහා ගැනීම අපහසු නො වේ.

එහෙත් , ඉන් අනතුරු කාල පරිච්ඡේදය තුළ අපගේ ජාතිය මෙන් ම අපගේ භාෂා

සාහිත්‍ය සම්ප්‍රදාය ද විසින් ප්‍රාර්ථිත එකී ගීත අවධිය නො එළඹුණේ ය.

එතෙකුදු වුවත්, දැන් අපට ගීතයක් හෙවත් ගීත සාහිත්‍යයක් ඇත. එම ගීතය තවමත් පවත්නේ, ළදරු අවධියේ ය.

ඉකුත් දශක දෙක තුළ, අපගේ සිංහල ගීතයේ ඇති වූ ප්‍රධානතම විපර්යාසය නම්, එය භාව පූර්ණ සුනිශ්ත සාහිත්‍ය නිර්මාණයක් බවට පත්වීම ය. ගීතය සාහිත්‍ය නිර්මාණයක් බවට පත්වීම යනුවෙන් අදහස් කෙරෙන්නේ කාව්‍ය සංකල්පනයක් , ගීතයෙහි හරය හෙවත් ආත්මය බවට පත්වීම ය. එබැවින් බොහෝ කාලයක් තිස්සේ, කලින් නිර්මාණය කරගන්නා ලද කිසියම් සංගීත රටාවක් තුළ සාහිත්‍යමය හික්මීමකින් තොර ව අමුණන ලද අර්ථ හීන වචන සමුදාය වෙනුවට, අර්ථවත් කාව්‍ය සංකල්පනයක් ගීතය තුළින් බිහි විය. මේ වූ කලී, අපගේ සිංහල ගීතය පැත්තෙන් බලන විට, ඉතා ම වැදගත් වර්ධනයකි. විප්ලවකාරී යයි කිව යුතු ප්‍රවණතාවකි. **ආනන්ද සමරකෝන්, සුනිල් ශාන්ත, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ මර්සලින් ජයකොඩි පියතුමන්** වැනි පුරෝගාමීන් විසින් අරඹන ලද එකී සාහිත්‍ය ව්‍යායාමය පරිසමාප්තියට පත් කරන ලද්දේ, මහගම සේකර විසිනි. මහගම සේකරයෝ අපගේ ගීතය නියත වශයෙන් අතිශය සුන්දර වූ ද, සංයත වූ ද, හරවත් සාහිත්‍ය නිර්මාණයක් බවට පත් කළහ.

"ඇත කඳුකර හිමව් අරණේ
සීත චන්දන ළපලු හෙවණේ
සුළං රැල්ලේ පාව එන්නේ
ඔහුගෙ නාමය වේ...................

සඳැල්ලේ මිණි තලාවේ
තාරකා පිපි වෙලාවේ
ළඳ ලියන්ගේ සීන අතරේ
මැවේ ඒ රූපේ ..................

සාහිත්‍ය ශික්ෂණයක පිහිටා සීරුවෙන් විමසා බලන කෙනකුට මහගම සේකරගේ පරිකල්පනයේ පෘථුල භාවයත් ඔහුගේ කවි ශක්තියේ විපුල බවත්, ස්වකීය ගීතයෙහි ලා කවියකු සේ අපගේ බස වහරන ආකාරයත් වටහා ගැනීමට මේ නිදසුන මඟින් වුවත් අපහසු නො වේ. මහගම සේකර විසින් මෙසේ පරිසමාප්ත සාහිත්‍ය නිර්මාණයක් බවට පත් කරන ලද සිංහල ගීතය, ඉකුත් දශකය තුළ යථාර්ථවත් සාහිත්‍ය නිර්මාණයක් බවට පත් වූ අයුරු අනේක විධ සාධක මඟින් දැන් අපට පෙන්වා දිය හැක්කේ ය.

නවකතාව, කෙටිකතාව හා නාට්‍යය වැනි අපගේ ප්‍රධාන සාහිත්‍යාංග දෙස බලන විට, එකී සාහිත්‍යාංග යථාර්ථවත් මඟට පිවිසියේ මෙයට බොහෝ කලකට ඉහත බැව් පෙනී යයි. එතෙකුදු වුවත්, වර්තමාන සිංහල කවිය ඒ මඟ ගැනීමට බොහෝ ප්‍රමාද වී ය. සැබැවින් ම අපගේ නවීන සිංහල කාව්‍ය, නිසැක ලෙස ම යථාර්ථවාදී මාර්ගයකට පිවිසියේ මහගම සේකරගේ "ප්‍රබුද්ධ" කාව්‍යය බිහිවීමත් සමඟ ය. කවියෙහි සහෝදරයා වූ ගීතය, යථාර්ථවාදී මඟට ප්‍රතිපන්න වීමට තවත් බොහෝ කලක් ගත විය.

යථාර්ථවත් කාව්‍ය මාර්ගයක් අනුගමනය කළ මහගම සේකර, යථාර්ථවත් ගීත මාර්ග යක් අනුගමනය නොකළේ ඇයි ?

මෙයට දිය හැකි පිළිතුර තුළ, සිංහල ගීතය යථාර්ථවත් මඟට ප්‍රවිෂ්ට වීමට ප්‍රමාද වීමේ හේතුව ද දැකිය හැකි ය.

ඉකුත් කාලය තුළ සිංහල ගීතය පෝෂණය වූයේ ගුවන්විදුලි මාධ්‍යයෙනි. මේ සම්බන්ධය සිංහල කවිය කෙරෙහි බලපැවැත්තේ නැත.

ගීත නිර්මාණය පිළිබඳ ස්වාධීන මාධ්‍යයන් කීපයක් ම පසුගිය දශකය තුළ නැඟී සිටිනු අප විසින් දක්නා ලදි. එකී මාධ්‍යයන් අතර ඒක පුද්ගල ගීත ප්‍රසංග, ස්වාධීන ලෙස නිර්මාණය කොට වෙළෙඳ පොළට පිවිසවන ලද ගීත තැටි හා කැසට්පට පමණක් නො ව, සිංහල ගීතය පිළිබඳ පුළුල් ලෙස ගීත ශ්‍රාවකයන් සමග කරන ලද සාකච්ඡා හා සම්මන්ත්‍රණ සඳහන් කළයුතු වන්නේ ය. ඊට  අමතර ව ප්‍රතිභා සම්පන්න  ගීත රචකයන් විසින් සාහිත්‍ය කෘතීන් සේ ප්‍රකාශයට පත් කරන ලද ගීත රචනා පිටපත් අඩංගු ග්‍රන්ථ ද සිංහල ගීතයේ දෘෂ්ටිය පුළුල් කරලීමට සමත් විය. මේ අයුරු අපගේ සිංහලයේ ගීත සිතිජය පුළුල්වීමත් සමග ම, සිංහල ගීතය  යථාර්ථවත් සාහිත්‍ය නිර්මාණයක් බවට පත් ව ආයේ ය.

යථාර්ථවත් සාහිත්‍ය රචනයක් බවට පත්වුණු ගීත, ගුවන් විදුලිය, රූපවාහිනිය ඇතුළු නානාවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන මාධ්‍යයන් මඟින් අද ඇසෙන්නට ලැබෙයි. මේ වනාහි අපගේ සිංහල ගීතය ලැබූ ප්‍රධාන ප්‍රතිලාභයකි. එම කාර්යය ඉටුකරන ලද්දේ  ගීත රචකයන් විසින් බව කිසිසේත් ම අමතක කළ හැකි නො වෙයි. සැබවින් ම යථාර්ථවත් ගීත නිර්මාණයේ පුරෝගාමී කාර්යය ඉටු කරන ලද්දේ ගීත රචකයන් විසිනි.

මේ ප්‍රවණතාවට සාක්ෂ්‍ය වශයෙන් ඉදිරිපත් කළ හැකි බොහෝ හරවත් ගීත  රචනා අප සතු ව ඇත. නිදසුනක් වශයෙන් **රත්නකන සිද්ධාර්ථ හිමියන්** විසින් රචිත මෙහි පහත දැක්වෙන ගීත ඛණ්ඩය දෙස බැලුව මැනවි.

"අව්වට වැස්සට හුරු මිනිසුන්ගේ
දැතේ විරියෙනි රටවල් නැගුණේ
ඒ මිනිසුන්ගේ මළගම වෙනුවෙන්
මොන රජ මැඳුරෙද සුදු කොඩි නැගුණේ "

(සංසාරේ අපි - පිටුව 22)

සිරිල් සමරකෝන් නමැති රචකයා ස්වකීය මැණියන් පිළිබඳ ව ලියූ මේ ගීතය විමසා බලමු .

"අඹර කුරක්කන් කළුවේ
ගලවට පිටි කොයි කළුවේ
කර කර කර කර කර කර
දෑතට ගත සවිය පුදා

ගල්ලැහැ පැදුරේ ඉඳගෙන
පහන් දැල්ල නිවෙන තුරා
නුඹ ඇකයට තුරුළු වෙලා
මැදියම් රෑ මං උන්නා

කර කර කර කර කර කර
පංකා සිහිලැල් පවනේ
ඉසුරු පිරුණු මන්දිරයේ
කුරහන් ගල ගොළු වී ඇත
නුඹේ ගී හඬ කෙඳිරිල්ලකි
මා සනසයි අම්මේ."

මේ රචකයා ස්වකීය මෑණියන්ගේ ගුණසමුදාය නිර්මාණය කරන්නේ අතිශයින් ම යථාර්ථවත් රීතියකිනි. එබැවින්, එහි ඇති හෘදයංගම බව හේතුකොටගෙන අප ළය කම්පා වෙයි. සිත් සතන් සනහාලයි.

සිංහල ගීතයේ යථාර්ථවාදී ප්‍රවණතාවෙහි දක්නා ලද විශේෂත්වය නම්, ගීතය මඟින් මිනිසුන් අතර වන සබඳතා සියුම් ලෙස නිර්මාණයකොට දැක්වීමට ගන්නා ලද වෑයමයි. කරුණාරත්න ජයතිලක නමැති ගීත රචකයා විසින් ලියන ලද "ඇටඹ ගහට පොලු ගැහුවේ" නමැති ගීතය මේ අතින් හෘදයංගම රචනයකි. යහළුවෝ දෙදෙන ගමේ පාසලේ එකට උගනිති. නිසි සේ උගත් "මහත්මයා" දැන් සිදාදියේ රැකියාවක් කරයි. විභාග පාස් නොකළ රංබණ්ඩා ගමේ තනිවෙයි. මහත්තයාට දැන් ඔහු අමතක ය. මේ පොදු අත්දැකීම, මේ රචනයෙහි ලා නිර්මාණය කොට ඇත්තේ ප්‍රබල ආකාරයෙනි.

"විභාගෙකින් පාස් වෙලා
ගමයි මමයි අතහැරලා
සිදාදියට පැන ගත්තා - මහත්තයා නං
මට නම් හොඳට ම මතකයි
එක ගමේ නෙ අපි දෙන්නා
මහත්තයට මතක නැද්ද - රංබණ්ඩා මං"

යට කී රචනය කුළුගැන්වෙන්නේ එකී උත්ප්‍රාසාත්මක, එහෙත් හෘදයංගම වැකියෙනි.

සිංහල ගීතයේ අනාගත අභිවෘද්ධියට ඉමහත් සේවාවක් සැලසීමෙහි නිරත ව සිටින යතිවරයාණ කෙනකුන් හැටියට **පල්ලේගම හේමරතන හිමියන්** හඳුන්වා දීමට හැකි ය. ස්වකීය ගීතයේ කාර්යභාරය කුමක්දැයි උන්වහන්සේ ඉතා නිසැක ලෙස ප්‍රත්‍යවේක්ෂා කොට ඇත්තේ ය.

"ලොවේ දුක දැක දයාබර වී
නෙතින් කඳුළක් නොහෙලුවේ නම්
ඔබේ නාමෙන්
කුමට සත්සර රාව නංවා
හිඳිම් ගොළු වී මම්

--දුගී දැතට අත් වැලක් වී
දිරිය සවි බල නොපිදුවේ නම්
ඔබේ නාමෙන්
කුමට සත්සර රාව නංවා
හිඳිම් ගොළු වී මම්"

උන්වහන්සේගේ මේ මුළු ගීත සමුදාය ම එකී දෘෂ්ටියෙහි පිහිටා ලියැවුණු කෘති යැ යි සැලකීමට බොහෝ හේතු යුක්ති ඇත්තේ ය.

ගීතය වූ කලී, කලින් නිශ්චිත, සුන්දර වචන ගොනුවක් හෝ මායාකාරී සංකල්පනා සමුදායක් හෝ නො වේ. මුලින් සඳහන් කළ පරිදි, සිංහල ගීතය යථාර්ථවත් සාහිත්‍ය භාෂණයක් බවට අද පත් ව ඇත්තේ ය.

මෙසේ මානව බන්ධුත්වයේ පුෂ්ප සුගන්ධය උතුරා යන තැන දක්වා, සිංහල ගීතය පැමිණ ඇත්තේ අභිමානවත් මාර්ගයක ය.

### අරුත් පැහැදිලි කිරීම්

| | | |
|---|---|---|
| ආහ්ලාද ජනක | . | සන්තෝෂය දනවන |
| උත්ප්‍රාසාත්මක | . | පවසන දෙයට ඉඳුරා ම ප්‍රතිවිරුද්ධ දෙයක් හැඟවීම |
| ගම්‍යමාන වන | . | හැඟෙන/කියැවෙන |
| ධ්වනි පූර්ණ | . | ශබ්ද හා අර්ථ දෙකින් පිරුණු |
| ධ්වනි සංවිධානය | . | ශබ්ද හා අර්ථවල මනා සැලැස්ම/ගැළපීම |
| පරිපාකයට | . | දියුණුවට/මුහුකුරායාමට |
| ප්‍රත්‍යවේක්ෂා | . | යළිත් සිහිනුවණින් සිතා බැලීම |
| මඟට ප්‍රතිපන්න වීම | . | මඟට එළැඹීම /බැසීම |
| මානව බන්ධුත්වය | . | මානවයා/මිනිසා සමඟ ඇති නෑදෑකම |
| මිහිරි සරින් | . | මිහිරි හඬින් |
| යථාර්ථවත් | . | සැබෑ අරුතින් යුත් |
| සම්භාව්‍ය සාහිත්‍යය | . | උසස් සාහිත්‍යය |
| සුනිශිත | . | මනා සේ තියුණු වූ |

## ක්‍රියාකාරකම 01

i. යම්කිසි ජනතාවකගේ ශිෂ්ටත්වය නිරූපණය වන ප්‍රධාන සාධකය කුමක් ද ?
ii. භාෂා වර්ධනයේ අග්‍රඵලය ලෙස මෙහි දක්වා ඇත්තේ කවර අංගයක් ද ?
iii. අපේ පැරණි ගී කාව්‍ය දෙකක් නම් කරන්න.
iv. සීගිරි කැටපත් පවුරට අපේ පැරණි සාහිත්‍ය භාණ්ඩාගාරය යැයි පවසන්නේ ඇයි?
v. සිංහල කවීන්ගේ පරිකල්පන හැකියාවත්, බසේ මිහිර පිළිබඳ දැනුමත් ගීත නිර්මාණයකට ආසන්න වූයේ කවර යුගයක දී ද?
vi. නූතන ගීත සාහිත්‍යයේ නවෝදයක් ඇති කළ රචකයන් දෙදෙනකු නම් කරන්න.
vii. "අඹර කුරක්කං කළුවේ " ගීතයේ අරුත ඔබේ වචනයෙන් ලියන්න.

## ක්‍රියාකාරකම 02

1. මේ පද සඳහා සුදුසු උපසර්ග පද යොදා වාක්‍යය බැගින් ලියන්න.
විශේෂ/ බල/ මහත්/ වෘද්ධිය/ ලෝකනය/ වර්ණය/ යෝගී/ ගන්ධය/ පිරි/ පූර්ව

2. මේ වාක්‍යවල හිස්තැන්වලට සුදුසු පද දී ඇති වචන අතරින් තෝරා යොදන්න.

| | | |
|---|---|---|
| හරවත් පදමාලාවක් | ගීතාත්මක ස්වරූපය | ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් |
| ශබ්ද මාධුර්යය | නර්තන විලාසය | සභ්‍ය ජනතාවක් |
| සම්භාව්‍ය සාහිත්‍ය | අනුවේදනීය | පුරෝගාමී කාර්යයට |
| වින්දන ශක්තිය | | |

i. සාහිත්‍යයට ළැදි සෞන්දර්යය අගය කළ ................................... අතීතයේ සිටි බවට සීගිරි කැටපත් පවුර ප්‍රබල නිදසුනකි.
ii. අනුරාධපුර යුගයේ ............................................ තිබූ බවට සාක්ෂ්‍ය බහුල ය.
iii. ගීතයට ................................. පමණක් නො ව .................................... ද තිබිය යුතු ය.
iv. රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා."
v. ගුත්තිල කාව්‍යයේ එන මේ කවිය ළඳුන්ගේ ................................... චිත්ත රූපයට නඟයි.
vi. අපේ මුතුන් මිත්තන්ගේ සාහිත්‍ය රුචිය ......................................... ග්‍රන්ථ තුළ පිළිබිඹු වේ.
vii. ජනතාවගේ .................... වර්ධනය කිරීමේ ........................... සහාය විය යුත්තෝ සාහිත්‍යකරුවෝ ය.
viii. සාගර පලන්සූරිය කවියාගේ 'සුදෝසුදු' .................. අත්දැකීමක් පදනම් කරගෙන ලියැවුණකි.

### පැවරුම්

i. මවුගුණ කියැවෙන ගීත එකතු කර කුඩා පොතක් සකසන්න.
ii. 'සිංහල ගීතය' මැයින් රචනයක් ලියන්න.
iii. 'ගීත සාහිත්‍යය' මාතෘකාව යටතේ සිංහල සාහිත්‍ය සමිතියේ දී කථාවක් කරන්න.